වස්තූන් උපමා රූපක ලෙස ගැනීමට කවියා උත්සාහ කොට ඇති අතර, එය නාට්‍ය මාලාවේ කථා පුවත හා බෙහෙවින් සැසඳෙන්නකි.

මෙම ගීතය නිර්මාණය කළ මහින්ද දිසානායක නම් වූ ප්‍රතිභාන්විත කවියාගේ නිර්මාණ දෙස බලන විට පෙනී යන කරුණක් නම් සිය අනුභූතීන් ඉදිරිපත් කිරීම සඳහා ඔහු චිරන්තන සාහිත්‍යයෙන් හා ජනශ්‍රැතයෙන් ලබා ඇති එළිය ඔහුගේ නිර්මාණ සාර්ථක වීමට විශාල පිටුවහලක් වී ඇති බවයි. මෙම ගීතය තුළ නන් වැදෑරුම් උපමා රූපක ගෙන එමින් කවියා සාක්ෂාත් කිරීමට උත්සාහ දරා ඇත්තේ එකම උක්තියකි. අපට සමීප ජන කවියේ පුනරුක්තිය නිසි ලෙස ප්‍රයෝජනයට ගනිමින්









ස්ථායි කොටසත්, පළමු හා දෙවන අන්තරායි කොටස් දෙකත් යොදාගෙන ඇත්තේ තුන්වන අන්තරායි කොටසින් අගවන අර්ථය උද්දීපනය කිරීම සඳහායි. ආකෘතිමය වශයෙන් මෙවැනි පද්‍ය ඕනෑ තරම් ජනකවියේ දැකිය හැකිය.

ඉර බාරයි ඉර වට යන හිරවුන්ට
--- සඳ බාරයි සඳ වට යන සාවුන්ට
මල බාරයි මල වට යන බඹරුන්ට
- - අපි බාරයි සත්පත්තිනි දෙවියන්ට

විමලාවතී දකින සමාජය අශ්ලීලත්වයෙන් හා දුෂ්ටත්වයෙන් පිරී ඇත. කුරිරුලොවින් මිදී යා හැකි නම් එය සැපතකැයි ඇය සිතයි. "මල් නොතලා මල් පැණි බොන බඹරුන් වේ නම්," තමා අපේක්ෂා කරන ගුණ ගරුක ලෝකය විමලදාස තුළින් දකින විමලාවතී සරාසිරම ගැන නොසලකා ඔහු වෙත බැඳේ. විමලදාස ගේ සෙනෙහසේ මෘදු ගුණය කවියා පවසන්නේ "මල් නොතලා මල් පැණි බොන" යන "උපමාවෙනි. විදාගම මෛත්‍රී හිමියන් මෙම උපමාව මුදුගුණ අලංකාරයේදී යොදා ගන්නේ වෙනත් අර්ථයක් හැඟවීම පිණිසයි.

රොන් අරගෙන සෙමෙන් -
යන බිඟු ලෙසින් කුසුමින්
ලොවට දුක් නොදෙමින්
ගනිති අය පඬුරු පෙර නියමෙන්
රජු මහජනතාවට බරක් නොවී අයබදු ගත් ආකාරය මෙහි කියවේ.
"ගැට නොතලා ඵල වළඳන සියොතුන් වේ නම්" - "ඒ සියොතුන් ලිය වදුලට මල් රූ අන්දම්"

වගෙන් ඵල වැළ බුදින බොහෝ කුරුල්ලෝ ළපටි ගැට කඩා ලියවැලට හානි කරති. එහෙත් එසේ ජන සමාජයට හානි නොකරන දුලභ මිනිසුන්ද සිටී. විමලදාස ද එවැන්නෙකි. ජීවිතය නම් ලියවැල සරසන්නේ එවන් දයාබර මිනිසුන්ය. "ඒ සාමුව ලිය ගොමුවට - නැසියො අන්දම් " ලියමඬුල්ලේ දුව පැන යන විසේකාර වඳුරන්, අතුපතර ගමන් කරන්නේ ගස ගැන හැඟීමක් නොකරමිනි. අවශේෂ සමාජය පිළිබඳව මානව ප්‍රේමයෙන් කටයුතු කරන මිනිසුන් විරලය. හිරිහැරයෙන් හා අවිහිංසාවෙන් පිරී ලෝකයක කිසිවෙකුගේ සිත නොරිදන විමලදාසගේ දසුන විමලාවතීගේ දෙනෙතට රසඳුනකි. ඔහුගෙන් ලැබෙන පවිත්‍ර සෙනෙහස ඇගේ හදවතට මල් වැස්සකි. "සිත නොතලා සෙනෙහස දෙන සකි සඳ වේ නම් - හද මිහිලිය නලවන සකි මල් වැහි අන්දම්"

මෙම ගීතය මහින්ද දිසානායක කවියා ටෙලිනාට්‍ය සඳහා ලියන ලද්දක් නොවීය. එය ඊට පෙර නිකුත් කරන ලද කැසට් පටයක අඩංගුව තිබිණ. ජාතික ළමාරක්ෂණ අධිකාරිය වෙනුවෙන් ලියන ලද මෙම ගීතය අපචාරය හා සදාචාරය නමින් උද්දෘත වී තිබුවකි. "දෙරණ" නාට්‍ය නිෂ්පාදනය කරන අවධියේදී නාට්‍ය මාලාව සඳහා තේමා ගීතයක් අවශ්‍යව තිබිණ. රූපවාහිනී නාට්‍ය අංශයේ ප්‍රධානී විමලරත්න අධිකාරී මල් නොතලා" ගීතය ඊට සුදුසු යැයි තීරණය කළේ කථා තේමාව හා එය සැසඳෙන බැව් දුටු හෙයිනි. නාට්‍යාරම්භක නාමාවලියට යොදාගත් සිත්තම් කරන ලද ප්‍රධාන චරිත වල රූ සටහන් කිහිපයක් සහිත රූපාවලියක් මත ගීතය ඇසෙන්නට සැලැස්වේ. **දෙරණ ටෙලිනාට්‍යය සුමති සම්මාන 07 ක් හිමිකරගත් අතර, "මල් නොතලා " ගීතය එම වසරේ හොඳම ගීත රචනයට හිමි සම්මානය දිනා ගත්තේ ය.**



නාමල් ප්‍රසන්න.